72 (ඉ)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 අගෝස්තු මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 4.50 යි.** තැපැල් ගාස්තුව : රු. **3.50 යි.**

# 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින.]

එල්. ඩී.— ඕ. 22/93.

## 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1980 අංක 47 දරන පනතේ 23අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :-

"මේ පනත යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නේ යම් කටයුතු සම්බන්ධයෙන් ද ඒ කටයුතු අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු බව.

23 අ. (1) දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටමං කිරීමක්, තැන්පත් කිරීමක් හෝ මෝචනය කිරීමක් කෙරෙන හෝ එවැනි ප්‍රතිඵලයක් ඇති කෙරෙන කටයුතු වන්නා වූ ද (මෙහි මින් මතු "නියමිත කටයුතු" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියමිතව ඇත්තා වූ ද කටයුතු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින් –

(අ) අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ ;

සහ

(ආ) මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හා වෙනත් උපමානවලට අනුකූලව

හැර, යම් නියමිත කටයුත්තක් කරගෙන යනු නොලැබිය යුතු ය.

2—D 047357—4,400 (98/03)

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය කඩකරමින් යම් නියමිත කටයුත්තක් කරන සෑම තැනැත්තකු ම, වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට –

(අ) රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ එක් වර්ෂයකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුළත (2) වන උපවගන්තිය යටතේ වූ බලපත්‍රයක් ලබා ගත යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු, ඒ උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිශ්චය කරන ලද කාලය ඇතුළත බලපත්‍රයක් ලබා නොගෙන කටයුත්ත නොකඩව කරගෙන යන අවස්ථාවක, එය වසා දැමීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, (2) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා බලපත්‍රයක් ලබාගෙන එසේ ලබාගත් බලපත්‍රයේ පිටපත අධිකරණයට ඉදිරිපත් කරන තුරු, කර්මාන්ත ශාලාව හෝ ඒ නියමිත කටයුත්ත කරගෙන යනු ලබන ස්ථානය වසා දැමිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආ වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 1988 අංක 56 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "මාස දොළහක කාලයකට" යන වචන වෙනුවට "අවුරුදු තුනක කාලයකට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආආ වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1988 අංක 56 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(2) ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයට පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් ලැබුණු විට, එම ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින්, (1) වන උපවගන්තිය යටතේ පනවන ලද නියමවලට අනුකූලව, එක් එක් ප්‍රවෘත්ති පත්‍රයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලබන දැන්වීමක් මගින් මහජනතාවට ඒ වාර්තාව පිළිබඳව කිසියම් අදහස් දැක්වීමට ඇත්නම් ඒ වාර්තාව පරීක්ෂා කරනු පිණිස, ඒ වාර්තාව තබන ස්ථානය සහ වේලාවන් දැනුම් දිය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එක් කිරීමෙන් :-

"(5) (1) වන උපවගන්තිය යටතේ පැනවූ නියමවලට අනුකූලව ඉදිරිපත් කරන ලද මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් (21 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ 74 වන සහ 76 වන වගන්තිවල කාර්ය සඳහා රාජ්‍ය ලේඛනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එය මහජනයා විසින් පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතු ය." .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.